# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,224 - 2021 අප්‍රේල් මස 16 වැනි සිකුරාදා - 2021.04.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 906 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 907 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 911 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 914 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 915 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 මැයි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


905- B 82222 - 5,403 (2021/04)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු සඳහා ආරාධනය

**ALCO/DLW 16 - CYL. 251 - B වර්ගයේ අංගසම්පූර්ණ M 8 පංතියේ ලොකොමොටිව් එන්ජින් 02ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය SRS/F. 7667

ශ්‍රී ලංකාව, බත්තරමුල්ල, ''සෙත්සිරිපාය'' අදියර II, 7 වන මහල, ප්‍රවාහන අමාත්‍යාංශයේ, අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ALCO/DLW 16-CYL. 251 - B වර්ගයේ අංග සම්පූර්ණ M8 පංතියේ ලොකොමොටිව් එන්ජින් 02ක් සැපයීම සඳහා නිෂ්පාදකයින්/ලංසුකරුවන් සහ වෙනත් යෝග්‍ය සංවිධාන වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

ලංසුකරුවන් ඔවුන්ගේ ලංසු සෘජුව හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හා ඇටෝර්නි බලපත්‍රයක් මගින් ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයෙකු මාර්ගයෙන් තම මිල ගණන් ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු භාරගැනීම 2021.05.17 දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් කෙරේ.

03. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ශ්‍රී ලංකා රුපියල් හතළිස් පන්දහසක (රු. 45,000.00) ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් 2021.03.31 දින සිට 2021.05.13 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාව) ලංසු ලිපිලේඛන සමග ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු ය. විදේශීය ලංසුකරුවන්ට ඉහත නියම කොට ඇති දිනයන්හි දී ශ්‍රී ලංකා රුපියල් හතළිස් පන්දහසකට (රු. 45,000.00) වටිනාකමට සමාන පහසුවෙන් පරිවර්තනය කරගත හැකි විදේශ මුදල් වර්ගයකින් තමන්ගේ රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාලයන් වෙත ප්‍රසම්පාදන ගාස්තුව ගෙවා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරිවරයාගේ ලංසුකරණ ලිපිලේඛන ගෙනැවිත් භාරදෙන මෙන් තානාපති කාර්යාලය, මගින් ඉල්ලා සිටිය හැකි ය ඉහත සඳහන් ශ්‍රී ලංකා රුපියල් හතළිස් පන්දහසක (රු. 45,000) (හෝ පරිවර්තනය කර ගත හැකි විදේශ මුදල් වර්ගයකින් සමාන මුදල) ආපසු ගෙවනු නොලැබේ.

04. ලංසු සමග ලංසුකරණ ලිපිලේඛනවල නියම කොට දක්වා ඇති පරිදි ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු ය. අවශ්‍ය ලංසු සුරක්ෂණය සඳහා සමාන මුදල පහසුවෙන් පරිවර්තනය කරගත හැකි මුදල් වර්ගයකින් නිශ්චය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශිත, ලංසු භාර ගැනීමේ අවසාන දිනට දින 28 කට පෙර දින පවත්නා විකුණුම් විනිමය අනුපාත අදාළ වනු ඇත.

05. පූර්ව ලංසු රැස්වීම 2021.04.29 දින පෙ.ව . 10.00 ට ශ්‍රී ලංකාව, බත්තරමුල්ල, ''සෙත්සිරිපාය'' අදියර II, 7 වන මහල, ප්‍රවාහන අමාත්‍යාංශයේ ශ්‍රවනාගාරයේ දී පැවැත්වෙනු ඇත.

06. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, බත්තරමුල්ල, ''සෙත්සිරිපාය'' අදියර II 7 වන මහල, ප්‍රවාහන අමාත්‍යාංශයේ දී ලංසු විවෘත කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

07. මුද්‍ර තැබූ ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති, අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව, ප්‍රවාහන අමාත්‍යාංශය, 7 වන මහල, සෙත්සිරිපාය, අදියර II, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

08. ලංසුකරණ ලිපිලේඛන, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකි ය.

09. වැඩිමනත් විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
විද්‍යුත් තැපෑල : srs.slr@sltnet.lk
gmrslr@sltnet.lk
වෙබ් අඩවිය : www.railway.gov.lk
යොමු අංකය : SRS/F 7667

සභාපති,
අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ
ප්‍රසම්පාදන කමිටුව.
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-523

# බඩු බාහිරාදිය විකිණීම්

**රක්වාන සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - රක්වාන**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රක්වාන සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2021.05.08 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් පාන්නෙක් වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට පෙර රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක අදාළ භාණ්ඩය වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

05. මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාර නොගැනේ.

07. ගැණුම්කරුවන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ඒ. එන්. ආර්. පෙරේරා,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
පැල්මඩුල්ල.

2021 මාර්තු 29 වැනි දින,
පැල්මඩුල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත නඩු භාණ්ඩ**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | 77464 | ඇලුමිනියම් මුට්ටි 01යි |
| 02. | 83154 | ගැරුම් වට්ටි 01යි |
| 03. | 89342 | අඩි 17 දිග කඹ 01යි |
| 04. | 89413 | ගැරුම් වට්ටි 01යි, කුඩ 01යි, උදළු 01යි, ඉල්ලන් කුරු 01යි, කැට කුඩ 01යි, කුඩා අලවංගු 01යි |
| 05. | 89452 | උදළු 01යි, ඉල්ලන් කුරු 01යි, කැට කුඩ 01යි, කුඩ 02යි |
| 06. | 92015 | කල 01යි, ප්ලාස්ටික් බාල්දි 01යි |
| 07. | 92303 | ගැස් ලිප් 01යි |
| 08. | 92444 | කිලෝ ග්‍රෑම් 12.05 ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩර් 02යි<br>රෙගියුලේටරය සහිත වට 03කින් හා 04 කින් යුත් ගෑස් ලිප් 02යි |
| 09. | 93225 | උදළු 01යි, කැට කුඩ 01යි |
| 10. | 93721 | ප්ලාස්ටික් බකට් 01යි |
| 11. | 94195 | සිංගර් වර්ගයේ වතුර මෝටර් 01යි, අඩි 123.05 ක් දිග බට 01යි, මීටර් 100ක් දිග ඇම්පියර් 15 වයර් 01යි, උදළු 01යි, වේවැල් කුඩ 02යි, කුලු ගෙඩි 01යි |
| 12. | 94265 | ගැරුම් වට්ටි 01යි, ඇඳුම් උදළු 01යි, උදළු 01යි |
| 13. | 94379 | උදළු 01යි, වේවැල් කුඩ 01යි, ඉල්ලම්කුරු 01යි |
| 14. | 94461 | සවල් 01යි, වේවැල් කුඩ 01යි, පොහොර උර 01යි |
| 15. | 94486 | කළුපාට ප්ලාස්ටික් ටැංකි 01යි |
| 16. | 93223 | ගැරුම් වට්ටි 01යි, වේවැල් කුඩ 02යි |
| 17. | AR. 170/21 | ගැරුම් වට්ටි 02යි, හිස් පොහොර උර 20යි |
| 18. | AR. 171/21 | සවල් 02යි, බාල්දි 01යි |
| 19. | 89671 | උදළු 01යි, ගැරුම් වට්ටි 01යි, පොඩි කුඩ 01යි, SAMSUNSG DUOS වර්ගයේ ජංගම දුරකථන 01යි, NOKIA වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 20. | 90042 | ගැරුම් වට්ටි 01යි, පොහොර කවර 03යි, කුඩ 01යි. |
| 21. | 81211 | ගැස් ලිප් 01යි, ගැස් සිලින්ඩර් 01යි |
| 22. | 90040 | ගැරුම් වට්ටි 01යි, පොහොර කවර 03යි |
| 23. | 90041 | උදළු 01යි, පොහොර කවර 04යි, කුඩ 01යි |
| 24. | 94016 | උදළු 01යි |
| 25. | AR. 231/21 | ප්ලැටිනා වර්ගයේ යතුරු පැදි 01යි |
| 26. | 93641 | වැලි කියුබ් 1/4 යි |
| 27. | 94261 | වැලි කියුබ් 1/4යි |
| 28. | බැරල් | 30යි |
| 29. | ලොකු බූලි | 100 යි |
| 30. | පොඩි බූලි | 100 යි |
| 31. | වීදුරු බෝතල් | 100 යි |

04-505

## මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ වැලි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද වැලි කියුබ් 40ක් 2021.04.30 වැනි දින පෙ. ව. 9.30 ට මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසියේ මිළ දී ගනු ලබන වැලි සඳහා මුදල් ගෙවීමේ දී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණක් ගෙවීම් සිදු කළ යුතු අතර චෙක්පත් බැංකු අණකර කිසිවක් භාර ගනු නොලැබේ.

03. භාණ්ඩ මිලදී ගැනීමේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

04. වෙන්දේසියෙන් මිළ දී ගන්නා ලද වැලි වෙන්දේසිය පවත්වන දිනයේ දී ප.ව. 5.00 ට පෙර අදාළ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම්, වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

හර්ෂණ ධනුෂ්ක රත්නායක,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
පොළොන්නරුව.

2021 අප්‍රේල් මස 06 වැනි දින,
පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | අධිකරණය | වැලි කියුබ් ප්‍රමාණය |
|---|---|---|
| 01. | මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය | 40 |

04-622

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - පිලැස්ස

### රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදල රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2021.04.25 වැනි දින පෙ. ව. 10.00ට පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් දක්වන්නෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ආර්. කේ. ආර්. ජයවර්ධන,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - පිලැස්ස.

2021 අප්‍රේල් මස 05 වැනි දින,
පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### භාණ්ඩ උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | 82342 | NOKIA වර්ගයේ ජංගම දුරකථන 01යි<br>IMEI 1-356018088516341/356018088516358 |
| 02. | 88776 / B119/20 | E - Tel වර්ගයේ ජංගම දුරකථන 01යි<br>IMEL - 1/351876100274018<br>IMI - 2 - 351876100274826<br>රබර් සෙරෙප්පු ජෝඩු 01යි |
| 03. | 80716 | යකඩ සවල් 01යි<br>ප්ලාස්ටික් බේසම් 01යි |
| 04. | 80654 | යකඩ සවල් 01යි |
| 05. | 83516 / B493/17 | සකුරා වර්ගයේ බිත්ති ඔරලෝසු 01යි<br>හියුගෝ වර්ගයේ වොට් 800 ඩ්‍රිල් මැෂින් 01යි |
| 06. | AR 417/19 | උදලු 01යි<br>යකඩ ඉනි 01යි<br>කියත් 01යි |
| 07. | 77970 | ප්ලාස්ටික් පුටු 01යි |
| 08. | 80192 / B 289/16 | එක්සයිඩ් වර්ගයේ බැටරි 01යි<br>75 D 23 R පැනසොනික් වර්ගයේ බැටරි 01 |
| 09. | 79903 | 48 -3453 ලොරි රථය |
| 10. | 84350 | 42 - 8186 ලොරි රථය |
| 11. | 70334 | NwwQ - 3056 බජාජ් CT 100 යතුරු පැදිය |
| 12. | 85764 | 148 - 5458 හීරෝ හොණ්ඩා යතුරු පැදිය |
| 13. | 82020 | 103 ශ්‍රී 9995 යමහා යතුරු පැදිය |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 14. | 78861 | NWUK 9192 බජාජ් පල්සර් යතුරු පැදිය |
| 15. | B 568/18 | NWMS 9451 බජාජ් CT 100 යතුරු පැදිය |
| 16. | B 581/18 | අත් ට්‍රැක්ටරය හා ටේලරය කැබැලි ලෙස |
| 17. | 89114 | Spvp - 3174 බජාජ් ඩිස්කවරි යතුරු පැදිය |
| 18. | 76534 | 126 - 3806 යතුරු පැදිය |

04-647

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නාවලපිටිය

නාවලපිටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය හා හෙල්බොඩ සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ හා භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉහත අධිකරණවල නඩුවලට අදාළ රාජසන්තක කරන ලද භාණ්ඩ මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ හා භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ පහත සඳහන් ලැයිස්තුවල සඳහන් භාණ්ඩ 2021.05.08 වැනි දින පෙ.ව. 9.30 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ පෙ.ව. 9.30 ට පෙර හිමිකම් තහවුරු කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ.ව. 8.30 සිට පෙ.ව. 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදනම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිළදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදල්වලින් ගෙවිය යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිළදී ගන්නා සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, මිළදී ගන්නා ලද සියලුම භාණ්ඩ එදිනම ප.ව. 3.30 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

07. Covid - 19 වසංගත තත්ත්වය නිසා සෞඛ්‍ය මාර්ග උපදේශනවලට යටත්ව වෙන්දේසිය පවත්වනු ලැබේ.

නිලන්ත විමලරත්න,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා අධිකරණය,
නාවලපිටිය.

2021 අප්‍රේල් 06 වැනි දින,
නාවලපිටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### නාවලපිටිය දිසා /මහෙස්ත්‍රාත් අධිකරණයේ හා හෙල්බොඩ (සං) මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද භාණ්ඩවල ලැයිස්තුව

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 83021 | 12.5 Kg ලිට්‍රෝ වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 |
| 02. | 83474 | 12.5 Kg ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 |
| 03. | 83377 | 12.5 Kg ලිට්‍රෝ වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 04. | 83668 | කාන්තා කුඩා අත් බෑග් | 01 |
| 05. | 83666 | කුඩා ඉලෙක්ට්‍රික් බවුත් | 01 |
| 06. | 83515 | ස්ටීමර් | 01 |
| 07. | 84220 | අඟල් 1/2 ජල කරාම | 01 |
| 08. | 80601 | අත් කියත් | 01 |
| | | අත කොලු | 01 |
| | | මිටි | 01 |
| | | නියන් | 01 |
| 09. | 84319 | සින්තා පැදුරු | 01 |
| 10. | 46902 | 12.5 Kg ගෑස් සිලින්ඩරය | 01 |
| | | කහ පාට බටය සහිත ගෑස් ලිප් | 01 |
| 11. | 46209 | සකස් කරන ලද කළුගල් කැලි | 183 |
| 12. | 46755 | ටූනා වර්ගයේ දූවයෙන් ස ාදන ලද ජනෙල් පියන් | 02 |
| | | දිග මීටර් 1.10 හා පළල මීටර් 0.50 ප්‍රමාණයේ ජනෙල් පියන් | |
| | | ටූනා වර්ගයේ දූවයෙන් සාදන | 04 |
| | | දිග මීටර් 1.30 හා පළල මීටර් 0.50 ප්‍රමාණයේ ජනෙල් පියන් | |
| | | ටූනා වර්ගයේ දූවයෙන් සාදන දිග මීටර් 1.60 හා පළල මීටර් 0.50 | 02 |
| | | ප්‍රමාණයේ ජනෙල් පියන් | |
| | | මහෝගනී වර්ගයේ යතුගාන ලද ලී කැලි | 01 |
| | | දිග මීටර් 0.85 ඝණකම මිලි මීටර් 75 පළල මිලි මීටර් 100 කැලි | |
| | | මහෝගනී වර්ගයේ යතුගාන ලදලී කැලි | 01 |
| | | දිගු මීටර් 0.75 ඝණකම් මිලි මීටර් 756 පළල මිලි මීටර් 100 කැලි | |
| | | මහෝගනී වර්ගයේ යතුගාන ලද ලී කැලි | 01 |
| | | දිග මීටර් 0.55 ඝණකම මිලි මීටර් 75 පළල මිලි මීටර් 100 කැලි | |
| | | අත් කියත් | 01 |
| | | නියන් | 01 |
| 13. | 44251 | නිල්පාට බැරල් (ප්ලාස්ටික්) | 02 |
| | | කළුපාට බැරල් (ප්ලාස්ටික්) | 01 |
| | | සුදුපාට ප්ලාස්ටික් බාල්දි | 01 |
| | | කහපාට බාල්දි | 01 |

**නාවලපිටිය දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ හා හෙල්බොඩ සං/මහෙස්ත්‍රාත් අධිකරණයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ලැයිස්තු**

*නාවලපිටිය දිසා මහෙස්ත්‍රාත් අධිකරණය :*

| අනු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය (තොගය වශයෙන්) | තත්ව පරීක්ෂණ වර්තාව |
|---|---|---|---|
| 01. | යතුරුලියන | 08 | ඇතුළත කොටස් දිරාපත් වී ඇත |
| 02. | ප්‍රින්ටර්ස් | 03 | අලුත්වැඩියා කළ නොහැක |
| 03. | මොනිටර් | 05 | ඉතා පැරණි බැවින් අලුත්වැඩියා කළ නොහැක |

*හෙල්බොඩ සං/මහෙස්ත්‍රාත් අධිකරණය :*

| අනු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය (තොගය වශයෙන්) | තත්ව පරීක්ෂණ වර්තාව |
|---|---|---|---|
| 01. | ඇඳි පුටු | 05 | කැඩී ඇත. අලුත් වැඩියා කළ නොහැක |
| 02. | ඇඳි රහිත පුටු | 05 | කැඩී ඇත. අලුත් වැඩියා කළ නොහැක |

04-685

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - මඩකලපුව**

**ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම**

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවලදී රාජසංතක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2021.04.24 වැනි දින පෙරවරු 9.00 ට මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට නියමිතය.

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහිදී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදු කරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගිවීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මඩකලපුව.

2021 මාර්තු මස 30 වැනි දින.

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය**

| අංක | නඩු අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ | අයිතම ගණන |
|---|---|---|---|---|
| 1. | AR/624/20 | EP JK - 2437 | යතුර පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 2. | AR/693/20 | EP BEM - 4913 | යතුර පැදිය | 01 |
| 3. | AR/694/20 | EP JW - 8544 | යතුර පැදිය | 01 |
| 4. | AR/695/20 | EP TB - 9222 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 5. | 38343/PC | EP HP - 9835 | යතුරු පැදිය | 01 |
| 6. | 61106/MT/20 | EP GU - 7870 | යතුරු පැදිය | 01 |
| 7. | 62066/MT/20 | EP UH - 3211 | යතුරු පැදිය | 01 |
| 8. | B/885/20 | | පාපැදි | 01 |
| 9. | B/885/20 | | පාපැදි | 01 |
| 10. | B/885/20 | | පාපැදි | 01 |
| 11. | B/885/20 | | පාපැදි | 01 |
| 12. | B/885/20 | | පාපැදි | 01 |
| 13. | B/885/20 | | පාපැදි | 01 |
| 14. | B/885/20 | | පාපැදි | 01 |
| 15. | AR/431/20 | | Aluminium Fram | 03 |
| 16. | AR/116/21 | | ලිප | 02 |
| 17. | 62767/S/20 | | ඔරුව | 01 |
| 18. | 62768/S/20 | | ඔරුව | 01 |
| 19. | 62786/S/20 | | සවල් | 01 |
| 20. | 62970/S/20 | | සවල් | 01 |
| 21. | 62954/S/20 | | සවල් | 01 |
| 22. | 62969/S/20 | | සවල් | 01 |
| 23. | 62356/S/20 | | සවල් | 01 |
| 24. | 21539/PC/13 | | සවල් | 01 |
| 25. | 47708/PC/17 | | ජංගම දුරකථන | 02 |
| 26. | 42510/PC/16 | | ජංගම දුරකථන | 01 |
| 27. | No Number | | පාපැදි අමතර කොටස් පමණි | 01 |
| 28. | 51701/S/20 | | Refrigirator stand | 01 |
| 29. | 51701/S/20 | | Refrigirator stand | 01 |
| 30. | 51701/S/20 | | Refrigirator stand | 01 |

04-595

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - බලපිටිය**

මෙම අධිකරණයේ ඉදිරිපත් කර ඇති නඩුවලට අදාළව අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද හා අධිකරණයේ පවතින ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළව රාජසන්තක කරනු ලැබූ හා අධිකරණයේ පවතින ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2021.04.23 දින පෙ. ව. 10.00 ට බලපිටිය අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේදී හා මුදල් ගෙවීමේදී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

06. සියලු ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේදී පස්වරු 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

සී. ජේ. හංසදේව සමරදිවාකර,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බලපිටිය.

2021 මාර්තු මස 26 වැනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත වැලි සහ පස්**

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 01. | 35050 | වැලි කියුබ් 01 |
| 02. | 36372 | වැලි කියුබ් 01 |
| 03. | 35403 | වැලි කියුබ් 01 |
| 04. | 35258 | වැලි කියුබ් 01 |
| 05. | 36048 | වැලි කියුබ් 01 |
| 06. | 37042 | වැලි කියුබ් 01 |
| 07. | 36504 | පස් කියුබ් 01 |
| 08. | 36292 | පස් කියුබ් 01 |
| 09. | 34306 | පස් කියුබ් 01 |
| 10. | 36789 | පස් කියුබ් 01 |
| 11. | 36914 | පස් කියුබ් 01 |
| 12. | 37301 | පස් කියුබ් 01 |

04-591

**සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - ඒරාවූර්**

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

ඒරාවූර් සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද වැලි හා පස් 2021.04.24 වැනි දින පෙ. ව. 9.00ට ඒරාවූර් සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඇති වැලි කියුබ් 241.05 හා පස් කියුබ් 77ක් වෙන්දේසි කිරීමට ඇත.

ඒරාවූර් සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහි දී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳ කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදුකරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගිවීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

කේ. ජීවරාණි,
මහෙස්ත්‍රාත්,
සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය,
ඒරාවූර්.

2021 මාර්තු මස 30 වැනි දින.

04-579

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබැරුම් රේන්ද විකිණීම 2021/2022 වර්ෂය

**2021 ජූලි මස 01 සිට 2022 ජුනි මස 30 දක්වා**

2021 ජූලි මස 01 සිට 2022 ජුනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබැරුම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි අතර, එය නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු ය. එසේ ම, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

3. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක ........................................ දරන .............................................. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2021.05.03 දින පෙ.ව. 10.30 ට පෙර පුත්තලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර පුත්තලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

5. 2021.05.03 වන දින පෙ.ව 10.30ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

6. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2021.06.03 දින පෙ.ව . 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අදාල විය යුතු ය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එස්. ඒ. වයි. ආර්. ජයතිලක
ප්‍රාදේශීය ලේකම්,
පුත්තලම.

2021 අප්‍රේල් මස 01 වැනි දින.
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
පුත්තලම.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|---|---|
| 01 | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සේනකුඩිරිප්පුව | පෙ. ව 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 9.00 | 2021.05.03<br>පෙ. ව. 10.30 | රු. 1000/- |

04-609

---

## මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - පුත්තලම දිස්ත්‍රික්කය

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2021/2022 වර්ෂය - 2021 ජූලි මස 01 සිට 2022 ජූනි මස 30 දක්වා කාලය සඳහා - මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2021 ජූලි මස 01 වැනි දින සිට 2022 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම

සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ අංක.................................... දරන......................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2021.05.17 වැනි දින පෙ.ව. 10.30 ට පෙර මුන්දලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති, ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2021.05.17 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2021.06.21 දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථොක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(දුරකථන අංක : 032-2052271).

ජේ. ඒ. විජානි වසන්තිකා ,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2021 මාර්තු මස 30 වැනි දින,
මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|---|---|---|
| 01. | මුන්දලම | මුන්දලම | පෙ.ව. 11.00 | ප.ව. 2.00 | 2021.05.17 | 1,000 0 |
| | | | ප.ව. 5.00 | ප.ව. 8.00 | පෙ.ව.10.30 | |
| 02. | මුන්දලම | මදුරන්කුලිය | පෙ.ව. 11.00 | ප.ව. 2.00 | 2021.05.17 | 1,000 0 |
| | | | ප.ව. 5.00 | ප.ව. 8.00 | පෙ.ව.10.30 | |
| 03. | මුන්දලම | මුක්කුතොඩුවාව | පෙ.ව. 11.00 | ප.ව. 2.00 | 2021.05.17 | 1,000 0 |
| | | | ප.ව. 5.00 | ප.ව. 8.00 | පෙ.ව.10.30 | |
| 04. | මුන්දලම | උඩප්පුව | පෙ.ව. 11.00 | ප.ව. 2.00 | 2021.05.17 | 1,000 0 |
| | | | ප.ව. 5.00 | ප.ව. 8.00 | පෙ.ව.10.30 | |

04-548

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2021 මාර්තු 05 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : කස්තානේ සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00235936
ලියාපදිංචි ලිපිනය : අංක 359/1 ඒ, ගාලු පාර, ගල්කිස්ස, රත්මලාන

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

ග්‍රෙගරීස් පාර්ට්නර්ස්,
සමාගම් ලේකම්.

අංක 53/3 බී,
ග්‍රෙගරීස් පාර, කොළඹ 07.

04-382

## සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සමාගමේ නම 2021 මාර්තු 18 වැනි දින සිට වෙනස් කර ඇති බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමු.

සමාගමෙ මුල් නාමය : ඩෙන්ට්සු ඒජීස් නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 2572
ලියාපදිංචි ලිපිනය : නො. 176/1, තිඹිරිගස්යාය පාර, කොළඹ 05
සමාගමේ නව නාමය : ඩෙන්ට්සු කමිනිකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

එකවුන්ට්න් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

03 වන මහල,
නො. 11, කාසල් පටුමග,
කොළඹ 04.

04-392

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 11, හෙට්ටිවීදිය, අංක 247 දරන ස්ථානයේ පදිංචි සාවන්නා නාවිඅප්පා කුමාරප්පන් වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අඹගහ හේවගේ දෝන මංජුලා දමයන්ති මහත්මිය විසින් වර්ෂ 2009ක් වූ දෙසැම්බර් මස 21 වැනි දින ලියා සහතික කළ අංක 272 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු ලෙස, පුත්තලම, මදුරංකුලිය, පන්සල පාර, අංක 176 දරන ස්ථානයේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 603393791 වී) සිරිමැදුරලාගේ චන්ද්‍රසිරි යන අයව පත් කළෙමි. මෙකී අංක 272 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2020ක් වූ නොවැම්බර් මස 03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කොට අහෝසි කරන බවටත්, තවදුරටත් මෙකී විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ කිසිදු වලංගු භාවයක් හෝ නීතිමය ශක්‍යතාවයක් නොමැති බවටත් සියල්ලෝම මින් දැනගත යුතු ය.

සාවන්නා නාවිඅප්පා කුමාරප්පන්.

04-440

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමයි

කටාර් රාජ්‍යයේ දෝහා හි තැ. පෙ. 22550, කටාර් එයාර්වේස් සමූහයේ (Q. C. S. C) සමූහ ප්‍රධාන විධායක නිලධාරී AKBAR AL BAKER වන මා විසින්, 2019.05.20 දින, දෝහා කටාර් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තානාපතිවරයාගේ සුවිශේෂි ක්ෂේත්‍ර කටයුතු නිලධාරියා ඉදිරියේ ලියා සහතික කරන ලද, 2019 අප්‍රේල් මස 09 දිනැතිව, ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ලිඛිත අධිකාරී පොතෙහි දින පොත් අංක 8806, පත්ඉරු 99 හා 275 වෙළුමෙහි ඇතුළත් කොට 2019.06.04 දින ලියාපදිංචි කළ YO Cha An (මහජන චීන ජනරජයේ විශේෂ පරිපාලිත හොංකොං දේශයේ චීන විදේශ ගමන් බලපත්‍ර අංක K J0733457 හිමි) යන අය වෙත ප්‍රදානය කරන ලද ඇටර්නි බලපත්‍රය, 2020 ඔක්තෝබර් මස 06 වැනි දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව මෙයින් දැනුම් දෙනු ලබන අතර, අපගේ ඇටර්නි බලකරු ලෙස ඉහත සඳහන් YU Cha An යන අය විසින් අපගේ නමින් හෝ අප වෙනුවෙන් හෝ ඉහත සඳහන් ඇටර්නි බලපත්‍රය යටතේ කරනු ලබන ක්‍රියාවන් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් මින් ඉදිරියට අපගේ කිසිදු වගකීමක් නොමැති බව ද දැනුම් දෙනු ලැබේ.

Akbar al Baker

04-491

## රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී

ලියාපදිංචි අංක පීක්‍යු 125)

අංක 20, ආර්. ඒ. ඩී. මෙල් මාවත

කොළඹ 03

2007 අංක 07 දරන සමාගම් පනතේ 127 වගන්තිය ප්‍රකාරව රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී සමාගමෙහි කොටස් ලේඛනය, 2021 අප්‍රේල් මස 20 වැනි අඟහරුවාදා දින සිට 2021 අප්‍රේල් මස 22 වැනි බ්‍රහස්පතින්ද දින වෙන තෙක් (එම දින දෙක ද ඇතුලුව) වසා තැබීමට නියමිත බව අප විසින් මෙලෙස නිවේදනය කර සිටිමු.

රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී,
සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

04-516

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කිරිබත්ගොඩ ශාඛාව

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් 2011.06.30 සහතික කරන ලදඅ ංක 4142, 2017.06.29 වැනි දින සහතික කරන ලද අංක 5861 (මෙහි පළමු උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපල) සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් 2017.06.29 වැනි දින සහතික කරන ලද අංක 5860 (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ) දරන හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද බැදුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හිරාන් පැන්ටර්ලියොන් අබේසිංහ තනි අයිතිකරු සුපර් සොලිඩ් එච්. පී. ණයකර ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැදුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල් සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුලු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපල

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2021 මැයි 21 වැනි දින පෙ. ව. 11.30 දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව ම පවත්වනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ මහර ප්‍රාදේශීය සභාවේ නාරන්වල උප කාර්යාලය තුළ කිරිල්ලවල දකුණ අංක 287 ඩී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිල්ලවල ගමේ පිහිටි දෙල්ගහවත්ත හෙවත් ගොරකගහවත්ත නමැති ඉඩමට අංක 4544 දරන එකී පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දහතරයි දශම පහයි පහක් වූ (අ. 0, රූ. 0, පර්. 14.55) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ඇතුළුව සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා .- 2021.02.19 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2021.03.02 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කිරිබත්ගොඩ නගරයේ සිට කොළඹ - මහනුවර මහා මාර්ගය ඔස්සේ මහනුවර දෙසට 8 km පමණ ගමන් කර දකුණු පසින් ඇති නැගෙනහිර මාවත දෙසට හැරී (කිරිල්ලවල දම්රෝ ප්‍රදර්ශනාගාරය පසුකර 60m පමණ) ගමන් කර තවදුරටත් 525 m දිගටම ගමන් කර වම් අත පැත්තේ ඇති 3 වන පටුමගට හැරී 90 m ක් පමණ ගමන් කළ විට එම මාර්ගය අවසානයේ මෙම විෂය වස්තුවට අදල දේපළ හමු වනු ඇත. (6 වන වෙළුමේ ඇති දේපළ පිහිටීම දළ සටහන බලන්න)

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු ය. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව, පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 011- 2661866, 011- 2661828.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදල විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාමවිනිසුරු (මුළු දිවයිනටම)

නො. 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක 011 - 2053286/072 - 3207533
076- 9217329.

04-489

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කිරිබත්ගොඩ ශාඛාව**

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් 2011.06.30 සහතික කරන ලද අංක 4142, 2017.06.29 වැනි දින සහතික කරන ලද අංක 5861 (මෙහි පළමු උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපල) සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් 2017.06.29 වැනි දින සහතික කරන ලද අංක 5860 (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ) දරන හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හිරාන් පැන්ටර්ලියොන් අබේසිංහ තනි අයිතිකරු සුපර් සොලිඩ් එච්. පී. ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල් සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුලු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපල,

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2021 මැයි 21 වැනි දින ප. ව. 1.30 දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව ම පවත්වනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, මැද පත්තුවේ ගම්පහ මහ නගර සභා සීමාවේ යක්කල උප කාර්යාලය තුළ යක්කල දකුණු අංක 232/සී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යක්කල පිහිටි හන්සගිරිය පාරේ 16 වන පටුමගේ වරිපනම් අංක 57 දරන දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. පී. කස්තුරිරත්න විසින් 2010 නොවැම්බර් මස 28 වැනි දින පිළියෙල කරන ලද අංක 4552 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දහනවයයි දශම අටක් වූ (අ. 0 රූ. පර්. 19.8) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ඇතුළුව සියලු දේ ද වේ.

*වැඩි විස්තර සඳහා* .- 2021.02.19 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද, 2021.03.02 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කිරිබත්ගොඩ නගර මධ්‍යයේ සිට කොළඹ - මහනුවර මහා මාර්ගය ඔස්සේ මහනුවර දෙසට මිරිස්වත්ත හංදිය දක්වා 14 km පමණ ගමන් කර ඉන් පසු වම් අත දෙසට ඇති ගම්පහ පාරට හැරී 400 m ගමන් කර දකුණු අත පැත්තේ ඇති හංසගිරි පාරට හැරී 500 m පමණ ගමන් කර වම් අත දෙසට ඇති 16 වන පටුමගට හැරී 100 m ක් පමණ ඉදිරියට ගමන් කළ විට එම මාර්ගයටම යාබදව වම් අත දෙසින් මෙම දේපළ හමු වනු ඇත.

*ගෙවීමේ ක්‍රමය* :-

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු ය. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව, පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 011- 2661866, 011- 2661828.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදල විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාමවිනිසුරු (මුළු දිවයිනටම)

නො. 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක 011 - 2053286/072 - 3207533
076- 9217329.

04-490

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි

දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ දඹවිණි පළාත් කෝරළේ, උඩුකිඳ 59 ඩී දිවිතොටවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දිවිතොටවෙල ගමෙහි පිහිටි, ඉඹුල්ගහවගුරේ හේන නමැති බලයලත් මිනින්දෝරු එච්. එම්. සමරනායක මහතා විසින් මැන සාදන ලද වර්ෂ 2013.07.22 දිනැති අංක 7405 දරන පිඹුරෙහි ලොට් 1 යනුවෙන් දැක්වෙන ඉඩම වේ.

(බිම් ප්‍රමාණය අක්. 0, රූ. 1, පර්. 03.6)
වර්ෂ 2021 ක් වූ මැයි මස 10 වැනි දින පෙ. ව. 10.00 ට

*දේපළට පිවිසෙන මාර්ගය.* - වැලිමඩ නගර මධ්‍යයේ සිට, 19 වන කිලෝමීටර් කණුව දක්වා කිලෝමීටර් 1.5ක් පමණ දුරක් බණ්ඩාරවෙල පාර දිගේ ගමන් කරන්න. (ලූවිස් ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයට ප්‍රතිවිරුද්ධව) විෂයගත දේපළ ඔබගේ දකුණු අත පැත්තේ වැලිමඩ - බණ්ඩාරවෙල ප්‍රධාන පාරට මුහුණ ලා 19 වන කිලෝමීටර් කණුවට මීටර් 30කට පමණ පෙර පිහිටා ඇත.

චාර්ල්ස් කුමාරරත්න චමින්ද ධර්මසිරි අය අය ''බන්ධනදායී/උකස්කරු'' ලෙස ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද වර්ෂ 2016.09.02 වැනි දිනැති අංක 21768 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2017.04.28 වැනි දිනැති අංක 22081 දරන ද්විතීයක උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2019.08.09 වැනි දින දි අයිලන්ඩ්, දිවයින, තිනක්කුරල් පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමණාකරු, ණය අයකරගැනීම් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667412

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස් තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 0718446374 0777761706
ෆැක්ස් අංකය : 08112210595.

04-502

---

**සෙලාන් බැංකුව පීඑල්සී - වත්තල ශාඛාව**

**1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

කඳාන පදිංචි ගාර්දි හෙට්ටිආරච්චිගේ රොස්සිනි නිශාන්ත ලෝගුස් යන අය බැඳුම්කරු/උකස්කරු වශයෙන් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක මෙය විසින් දෙකම සහතික කරන ලද දෙකම 2015.10.07 දිනැති බැඳුම්කර අංක 2766 සහ 2767 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් දේපළ වර්ෂ 2021 ක් වූ මැයි මස 13 වැනි දින පහත සඳහන් කරන ලද වේලාවන්හි දී දේපළ පිහිටි ස්ථානයේ දී සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව මා විසින් වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*1 වන වෙන්දේසිය .-* වේලාව පෙ. ව. 11.00

මධ්‍යම පළාතේ, නුවරඑළිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ රම්බොඩ කෝරළේ තුළ කොත්මලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටුකිතුල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, කටුකිතුල පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එම්. එම්. ටී. කේ. මාරසිංහ විසින් සාදන ලද 2005.08.13 දිනැති අංක 930 දරන සැලැස්මේ නිරූපනය වන වරිපනම් අංක 14 දරන දඹගහහේන නමැති ඉඩම් කොටසේ ලොට් ඒ ලෙස ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තිස් එකයි (අ. 0, රූ. 0 පර්. 31) එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - පුස්සැල්ලාව නගරයේ සිට නුවරඑළිය පාර ඔස්සේ නුවරඑළිය දෙසට කි. මී. 8.8 ක් පමණ දුරින් ඇති කටුකිතුල උපතැපැල් කාර්යාලය දක්වා පැමිණ, එම පාර ඔස්සේම තවත් මීටර් 100ක් පමණ දුරින් ඇති කටුකිතුල කඩ වීදිය දක්වා පැමිණි පසු දකුණු පසින් වන්නට උතුරු මායිමෙන් පාර දෙසට මුහුණලා රංග කුෂන් වෙළෙඳ සැලට යාබදව මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*2 වන වෙන්දේසිය* - වේලාව පෙ. ව. 11.20

මධ්‍යම පළාතේ, නුවරඑළිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ රම්බොඩ කෝරළේ තුළ කොත්මලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටුකිතුල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, කටුකිතුල පිහිටි බලයලත් මිනින්දෝරු පී. වෙලගෙදර විසින් සාදන ලද 2011.09.16 දිනැති අංක 503 දරන සැලැස්මේ නිරූපනය වන නුවරඑළිය පාරේ වරිපනම් අංක 24 ඒ දරන දඹගහහේන නමැති ඉඩම් කොටසේ ලොට් 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම දෙකයි (අ. 0, රූ. 0, පර්. 3.2) එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - පුස්සැල්ලාව නගරයේ සිට නුවර එළිය පාර ඔස්සේ නුවරඑළිය දෙසට කි. මී. 8.8km. ක් පමණ දුරින් ඇති කටුකිතුල උප තැපැල් කාර්යාලය දක්වා පැමිණ එම පාර ඔස්සේම තවත් මීටර් 100ක් පමණ දුරින් ඇති කටුකිතුල කඩ වීදිය දක්වා පැමිණි පසු දකුණු පසින් වන්නට රංග කුෂන් වෙළෙඳ සැලට යාබදව මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම්.*- 2021.02.12 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, සිලෝන් ටුඩේ, දිනමිණ, සහ තිනකරන් පුවත් පත් හි 2020.12.09 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. අංශ ප්‍රධානී - නීති සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456485, 011- 2456479, 011- 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

නො. 9 - අයි. හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම
දුරකථන අංක : 071 - 4318252.

04-517

---

## සෙලාන් බැංකුව පීඑල්සී - ගොතටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

සුහසිංහ ආරච්චිගේ දොන් ඩිල්හාන් සංජීව යන අය බැඳුම්කරු/උකස්කරු වශයෙන් මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්, ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. රණ්වල විසින් සහතික කරන ලද 2017.12.18 දිනැති බැඳුම්කර අංක 108 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ 2021 ක් වූ මැයි මස 11 වැනි දින පෙ. ව. 11.45 ට දේපළ පිහිටි ස්ථානයේ දී සෙලාන් බැංකුව පීඑල්සී විසින් හා මා හට පවරණ ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

### *උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 491 කලපළුවාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ හේවාගම් කෝරළේ පල්ලේපත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාව තුළ කලපළුවාව පිහිටි බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්ලිව් කාවාලියෝ විසින් සාදන ලද 2011.02.18 සහ 19 දිනැති අංක 18/2011 දරන සැලැස්මේ නිරූපනය වන බුත්ගමුව පාර වරිපනම් අංක 54 බී දරන ඇඹරැල්ලාගහ කුඹුර හෙවත් ඇතාගල

කුඹුර නමැති ගස් ගොඩනැගිලි වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් බී 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 36.40) විශාල ඉඩම.

*දේපළට පිවිසීම.* - ගොතටුව නව නගරයේ සිට බුත්ගමුව පාර ඔස්සේ 1km ක් පමණ දුරින් ඇති මහ නියර හන්දිය දක්වා පැමිණ, තවත් මීටර් 225ක් එම පාරෙන් ම පැමිණ දකුණු පසට හැරී Password Total Motor Care අසලින් පාරක් සඳහා වෙන් කරන ලද කොටසින් මීටර් 50ක් ගොස් දකුණට තවත් මීටර් 25ක් ගිය පසු එම පාරේ අවසානයට වන්නට වම් පසින් මෙම දේපල පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම්.*- 2021.02.12 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ඩේලි අයිලන්ඩ්, අරුණ සහ තිනක්කුරල් පුවත් පත් හි 2020.12.08 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නීති ප්‍රධානී සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456485, 011- 2456479, 011- 2456473

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

නො. 9 - අයි. හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම
දුරකථන අංක : 071 - 4318252.

04-518

**සෙලාන් බැංකුව පීඑල්සී - වෙල්ල වීදිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

ගල්කිස්ස ලියාපදිංචි W - 201943 යටතේ MYD ඔටෝ ට්‍රේඩිං යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පත්වාගෙන යන ගල්කිස්ස පදිංචි දිනේෂ් සුරංග මල්ලවාරච්චි යන අය බැඳුම්කරු/ උකස්කරු වශයෙන් මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් කේ. කේ. ජී. ජී. සමින්තා විසින් සහතික කරන ලද 2015.03.09 දිනැති බැඳුම්කර අංක 564 ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. එස්. ද සිල්වා භාරතිරත්න විසින් සහතික කරන ලද 2016.05.05 දිනැති 1687 සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. කේ. ජී. ජී. සමින්තා විසින් සහතික කරන ලද 2017.05.15 දිනැති 793 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ 2021 ක් වූ මැයි මස 11 වැනි දින පෙ. ව. 9.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල - ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ 19 වටරප්පල ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාසය තුළ, වෝඩ් අංක 19 වටරප්පල තුළ, ගල්කිස්ස පිහිටි පොන්සේකා පාර, වරිපනම් අංක 7 සහ 7 1/1 දරන බලයලත් මිනින්දෝරු ජී. ඒ. එස්. එස්. පොන්නම්පෙරුම විසින් සාදන ලද 2016.04.19 දිනැති අංක 670 සැලැස්මේ නිරූපනය වන කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 බී 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩබ්ලිව්. සමරනායක විසින් සාදන ලද 2003.09.20 දිනැති අංක 1965 සැලැස්මේ නිරූපනය වන ලොට් බී 1 හි නැවත මැනීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ. 0, රූ. 0,පර්. 8) හෙක්ටයාර් 0.0202 විශාල ඉඩම.

*දේපළට පිවිසීම.* - කොළඹ සිට ගාල්ල දෙසට දිවෙන ගාලු පාරෙන් දෙහිවල හන්දිය පසුකර ගල්කිස්ස දක්වා පැමිණෙන්න. පසුව වමට හැරී Burger Kings අසලින් ඇති පීරිස් මාවතෙන් මීටර් 200 ක් ගොස් වමට හැරී පොන්සේකා පාරෙන් මීටර් 100 ගොස් වංගුව දක්වා පැමිණි පසු වම් පසින් වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම්.*- 2021.02.12 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ඩේලි මිරර්, ටැමිල් මිරර් 2020.12.25 දින ද, අද පුවත් පතෙහි 2021.02.11 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නීති ප්‍රධානී සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456485, 011- 2456479, 011- 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

නො. 9 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම
දුරකථන අංක 071 - 4318252.

04-519

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩී ජී ජේ ආර් පුෂ්පකුමාර.
ගිණුම් අංක : 0022 5002 0530.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.09.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දස කෝටි විසි අට ලක්ෂ අසූ තුන් දහස් තුන්සිය අසූ හයයි ශත අටක (රු. 102,883,386/08) මුදල ද, 2020 සැප්තැම්බර් 02 දින සිට අංක 3286, 3223, 3466 සහ 3468 දරන උකස් බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම කෝටි තුන් ලක්ෂ අසූ හය දහසක (රු. 90,386,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියල් තිස් පන් ලක්ෂ දස දහසක (රු. 3,510,000/-) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.29 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2020.10.19 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.05.31 වැනි දින උපලේඛන 01 හි සඳහන් දේපළ පෙ.ව. 11.15 ටද, උපලේඛන 03 හි සඳහන් දේපළ පෙ. ව. 11.45 ටද, උපලේඛන 02 හි සඳහන් දේපළ ප. ව. 12.15 ට ද පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ උඩුගහ පත්තුවේ සීතාවක නගර සභා සීමාවන් තුළ හංවැල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ සීතාවක අංක 432 B දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අවිස්සාවේල්ල පිහිටි ''මිල්ලගහකුඹුර නොහොත් කෝන්ගහකුඹුර'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ වෙලගෙදර යන අය විසින් සාදන ලද 2010 අප්‍රේල් 25 (2010 අප්‍රේල් 21- 23 උපබෙදුමක් සහ නැවත මිනුමක් වන) දාතම හා අංක 4827 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක. 550A දරණ පිඹුරේ නිරූපිත ලොට් 1 නැගෙනහිරට : මෙහි ලොට් 2 දකුණට : පාර බස්නාහිරට : පාර සහ අංක 550 A දරන පිඹුරේ නිරූපිත ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් තුනයි දශම අටයි හතයි පහක් (අ. 0, රූ. 1, පර්. 33.875) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 4827 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 243/101 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3286 සහ 3623 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ උඩුගහ පත්තුවේ සීතාවක නගර සභා සීමාවන් තුළ හංවැල්ල

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ සීතාවක නගර සභා සීමාවන් තුළ සීතාවක ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ අංක 432/B අවිස්සාවේල්ල රත්නපුර පාර පිහිටි ''හල්ගහකුඹුර සහ මිල්ලගහකුඹුර කෝන්ගහකුඹුර හි කොටසක්'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ වෙලගෙදර යන අය විසින් සාදන ලද 2006 නොවැම්බර් 22 (2019 ජුනි 21 දින මායිම් සත්‍යාපනය කරන ලද) දාතම හා අංක 4002 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඩී ජේ පී රොෂාන් කුමාර යන අය විසින් හිමිකම් කියනු ලබන අංක. 5030 දරන පිඹුරේ ලොට් 1 A නැගෙනහිරට : ඇළ කලගහවත්ත නොහොත් මිනෙරල් ස්ප්‍රිං එස්ටේට් දකුණට : අංක. 550A දරන පිඹුරේ ලොට් 3 බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් එකයි දශම හතරයි නමයක් (අ. 0, රූ. 1, පර්. 31.49) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 4002 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 282/57 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3466 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට)

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ උඩුගහ පත්තුවේ සීතාවක නගර සභා සීමාවන් තුළ හංවැල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ සීතාවක අංක. 432 B දරන ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ අවිස්සාවේල්ල පිහිටි ''මිල්ලගහකුඹුර නොහොත් කෝන්ගහකුඹුර'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ වෙලගෙදර යන අය විසින් සාදන ලද 2010 අප්‍රේල් 25 (2010 අප්‍රේල් 21- 23 උපබෙදුමක් සහ නැවත මිනුමක් වන) දාතම හා අංක 4827 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 550A දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නැගෙනහිරට : අංක. 1449 දරන පිඹුරේ ලොට් A; දකුණට : පාර; බස්නාහිරට : මෙහි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නමයයි දශම හතයි අටයි පහක් (අ. 0, රූ. 1, පර්. 9.785) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 4827 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 280/32 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3468 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

04-524

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

වයි. බී. ටී. කේ. පීරිස්.
ගිණුම් අංක : 1105 5430 7391.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.11.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැත්තෑ ලක්ෂ එකොලොස් දහස් හාරසිය අසූ නමයයි ශත පනස් නමයක (රු.7,011,489.59) මුදලද, 2020 නොවැම්බර් 10 දින සිට අංක. 4395 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් නම ලක්ෂ අනූ හත් දහස් පන්සිය පහයි ශත පනස් නමයක (රු.5,997,505.59) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළියද, දන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.03.19 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2021.03.05 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.05.25 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාවුල ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ, උඩෙසිය පත්තුව වගපනහ සහ නාවුල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කරවිලහේන ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ කරවිලහේන ග්‍රාමයේ පිහිටි ''ලිනියගොල්ලේයාය නොහොත් ලිනියගොල්ලයාය'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. කේ. කේ. ඒකනායක යන අය විසින් සාදන ලද 2016 දෙසැම්බර් 12 දාතම හා අංක 1144 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : නිවාසවලට පාර; නැගෙනහිරට : එස්. කේ. ගුණවර්ධන විසින් හිමිකම් කියන FVP 257 හි ලොට් 386, දකුණට : ආර්. පෙරේරා විසින් හිමිකම් කියන FVP 257 හි ලොට් 385 හි උධෘතයෙහි ලොට් B; බස්නාහිරට : නාවුල සිට පල්ලේගම දක්වා මහා මාර්ග යන මායිම් තුළ පිහිටි

ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහ අටක් (A 0, R 2, P 18) හෝ හෙක්ටයාර 0.2478 විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 1144 දරන එකී පිඹුරට අනුවය.

අංක 1177 දරන පිඹුරේ එකී ලොට් A පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ නාවුල ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ උදේසිය පත්තුව වගපනහ සහ නාවුල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කරවිලහේන ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ කරවිලහේන ග්‍රාමයේ පිහිටි ''ලිනියගොල්ලේයාය නොහොත් ලිනියගොල්ලයාය'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. ඩයස් යන අය විසින් සාදන ලද 2006 අගෝස්තු 18 දාතම හා අංක 1177 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : පාර සඳහා වෙන් කිරීම නැගෙනහිරට : එස්. කේ. ගුණවර්ධන විසින් හිමිකම් කියන FVP 257 හි ලොට් 386 නිරිතට : ආර්. පෙරේරා විසින් හිමිකම් කියන FVP 257 හි ලොට් 385 හි උඩාතයෙහි ලොට් B, වයඹට : නාවුල සිට පල්ලේගම දක්වා මහාමාර්ග යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහ අටක් (A 0, R 2, P 18) විශාල ඉඩම් කොටස පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 1177 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව Q 25/111 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04-525/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ආර්. ඩබ්ලිව්. එම්. පී. පී. විජේමාන්න.
ගිණුම් අංක : 0123 5000 3256.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.08.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් හතර ලක්ෂ පන්සිය හතලිස් එකයි ශත අනූ හතක (රු. 5,400,541.97) මුදලද, 2019 අගෝස්තු මස 01 වැනි දින සිට 2019 මැයි මස 31 දාතම හා හිමිකම් සහතිකපත් අංක 00362516864 හි එකී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් දෙලක්ෂ හැට දෙදහක (රු. 5,262,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවයි දශම පහක් (15.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.10.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.10.07 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.05.19 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ගඟ පළාත කෝරළේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, යාලේගොඩ නැගෙනහිර අංක 11 දරන ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ යාලේගොඩ නැගෙනහිර පිහිටි ''මහකුඹුරේවත්ත'' යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද කැඩස්තර් සිතියම් අංක 320285 හි බ්ලොක් 03 හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට පාර්සල් කැබිලි 0016 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර්සල් කැබිලි 15, නැගෙනහිරට : සඟබෝගම සිට පිලිගල්ල දක්වා ප්‍රාදේශීය සභා පාර, දකුණට : පාර්සල් කැබලි 17 සහ බස්නාහිරට : පාර්සල් කැබිලි 20 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි හතයි නමයක් (0.0279Hec.) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී කැඩස්තර් සිතියම් අංක 320285 ට අනුව හිමිකම් සහතිකපත් අංක. 00362516864 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04-525/2

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

සෙවන්ටීන් සී සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0113 1000 0509.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2017.09.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි හැට හත් ලක්ෂ හැත්තෑ නම දහස් අටසිය හතයි ශත අනූ හතරක (රු.26,779,807.94) මුදලද, 2017 සැප්තැම්බර් මස 04 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි පනස් ලක්ෂයක (රු.15,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) හා තවත් රුපියල් අනූ දෙලක්ෂයක (රු. 92,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2018.02.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2018.03.02 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.05.10 වැනි දින ප. ව. 2.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පහළ බියන්විල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඉහළ බියන්විල සහ පහළ බියන්විල පිහිටි මංකඩ පාර වරිපනම් අංක 61/5 දරන ''දඹුගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. එෆ් ජේ. පෙරේරා යන අය විසින් සාදන ලද 1984 සැප්තැම්බර් මස 29 දාතම හා අංක 9027 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : එච්. ඇසිලින් පෙරේරා යන අය විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ කොටසක්, ගිණිකොනට : මෙම ඉඩමේ කොටසක්, නිරිතට : මෙම ඉඩමේ කොටසක් සහ වයඹට : ලොට් 2 (අඩි 12 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (A. 0, R. 0, P. 30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක. 9027 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව N 308/08 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එච්. එම්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 මාර්තු මස 17 දාතම හා අංක 2750 දරන මැනකදී කරන ලද මිනුමකට අනුව ඉහත ඉඩම විස්තර කරනු ලැබ ඇති අතර එය පහත සඳහන් පරිදි :

එකී ඉහළ බියන්විල පිහිටි මංකඩ පාර වරිපනම් අංක 61/5 දරන ''දඹුගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 මාර්තු මස 17 දතම හා අංක 2750 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් අංක 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : එච්. ඇසිලින් පෙරේරා යන අය විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ කොටසක්, ගිණිකොනට : මෙම ඉඩමේ කොටසක්, නිරිතට : මෙම ඉඩමේ කොටසක් සහ වයඹට : අංක 9027 දරන පිඹුරේ ලොට් 2 (අඩි 12 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) හෝ හෙක්ටයාර 0.0759 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2750 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව N308/08 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04-525/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඉසුරුසිරි මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0057 1000 4511.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.09.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි තිස් අට ලක්ෂ හැත්තෑ හතර දහස් අටසිය අසූ එකයි ශත විසි නමයක (රු. 13,874,881.29) මුදල ද, 2019 අගෝස්තු මස 31 වැනි දින සිට අංක 1825 දරන උකස්

බැඳුම්කරය මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි තිස් දෙලක්ෂ හතළිස් නම දහස් හයසිය හතළිස් එකයි ශත අනූ අටක (රු. 13,249,641.98) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.11.01 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.10.25 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.05.20 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ඉංගිරිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වගවත්ත, අංක 618 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කළුපහන ග්‍රාමයේ පිහිටි "බෙරවාගොඩ" යයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන එම්. ආර්. ගිනිගේ යන අය විසින් සාදන ලද 2015 ඔක්තෝබර් මස 04 දාතම හා අංක 2135 දරන පිඹුරේ ලොට් 1 හි නැවත මිනුමක් වන තවත් අයුරකින් බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. ඩී. චන්ද්‍රාණි යන අය විසින් සාදන ලද 2004 අප්‍රේල් මස 24 දාතම හා අංක 700 දරන පිඹුරේ ලොට් 1 හි නැවත මිනුමක් ද එමෙන්ම බලයලත් මානක තැන ජේ. ඕ. ඕර් යන අය විසින් සාදන ලද 1943 අගෝස්තු මස 27 දාතම හා අංක 3273 දරන පිඹුරේ ලොට් 3 සහ 7 හි ඒකාබද්ධයක් ද වන) බලයලත් මානක තැන එම්. ආර්. ගිනිගේ යන අය විසින් සාදන ලද 2015 ඔක්තෝබර් මස 04 දාතම හා අංක 2135A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : බලයලත් මානක තැන එම්. ආර්. ගිනිගේ යන අය විසින් සාදන ලද 2015 ඔක්තෝබර් මස 04 දාතම හා අංක 2135 දරන පිඹුරේ ලොට් 2, මෙහි ලොට් 1B සහ බලයලත් මානක තැන ජේ. ඕ. ඕර් යන අය විසින් සාදන ලද අංක 3273 දරන පිඹුරේ ලොට් 5 සහ 8, දකුණට : අංක 3273 දරන පිඹුරේ ලොට් 5 සහ 8 සහ පිට ඇළ සහ බස්නාහිරට : අංක 3273 දරන පිඹුරේ ලොට් 6 සහ 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දහ අටයි දශම අටයි බිංදුවක් (A: 1, R: 2, P: 18.80) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2135A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව M 15/124 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04-546

LE/RE/208

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ වූ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 105500000096 සහ 105501000085

ණයකරුවන්ගේ සම්පූර්ණ නම් : දේවපුරගේ අනුරාධ රොෂාන් ප්‍රනාන්දු සහ මාලගොඩ ගමගේ දිනේෂා රත්මිණි මාලගොඩ.

(මෙහි මින් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2020.07.03 වැනි දින අංක 2183 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2020.10.22 වැනි දින ''මව්බිම'', ''තිනක්කුරල්'' සහ ''සිලෝන් ටුඩේ'' පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් **2021.05.11 වැනි දින පෙ. ව. 10.00** සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

අංක 2591 සහ 2592 දරන උකස් බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි හාරලක්ෂ පන්දහස් නවසිය අසූවයි ශත අනූ අට (රු. 10,405,980.98) ක මුදලක් වර්ෂ 2020.01.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01)

**පළමු ණය මුදල : 105500000096.**

අංක 2591 දරන උකස් බැඳුම්කරය යටතේ එකී පළමු ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්අට ලක්ෂ පනස්එක් දහස් එකසිය අසූදෙකයි ශත හැටහය (රු. 3,851,182.66) ක මුදල ද වර්ෂ 2020.01.31 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් තුන්ලක්ෂ තිස්එක් දහස් පන්සිය අනූපහයි ශත තිස්හය (රු. 331,595.36) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හතළිස් එක් ලක්ෂ අසූදෙදහස් හත්සිය හැත්තෑඅටයි ශත දෙක (රු. 4,182,778.02) ක මුදල අයකර ගැනීම සඳහා ද,

**දෙවන ණය මුදල : 105501000085.**

අංක 2592 දරන උකස් බැඳුම්කරය යටතේ එකී දෙවන ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස්හය ලක්ෂ හතලිස් නව දහස් හත්සිය දහතයි ශත අසූහය (රු. 5,649,717.86) ක මුදල ද, වර්ෂ 2020.01.31 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් පන්ලක්ෂ හැත්තෑතුන් දහස් හාරසිය අසූපහයි ශත දහය (රු. 573,485.10) ක් ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැටදෙලක්ෂ විසිතුන් දහස් දෙසීය දෙකයි ශත අනූහය (රු. 6,223,202.96)ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්කෝටි හාරලක්ෂ පන් දහස් නවසිය අසූවයි ශත අනූඅට (රු. 10,405,980.98) ක මුදලක් අයකර ගැනීම සඳහා ද,

(02) එකී පළමු ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් තිස්අට ලක්ෂ පනස්එක් දහස් එකසිය අසූදෙකයි ශත හැටහය (රු. 3,851,182.66) ද මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50%ක් ද සහ එකී දෙවන ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් පනස්හය ලක්ෂ හතලිස්නව දහස් හත්සිය දහතයි ශත අසූහය (රු. 5,649,717.86) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50%ක් ද බැගින් වූ පොළිය 2020.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් අටලක්ෂ අසූනව දහස් දෙසීය අසූවයි ශත හතලිස්හය (රු. 889,280.46) ක මුදල මත අයවිය යුතු මාසිකව 1.50%ක ප්‍රමාද පොළියක් 2020.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

ණය අංක : 105500000096 සහ 105501000085.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ සහ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසට අයත් අංක 557A - රාවතාවත්ත බටහිර ග්‍රාම නිලධාරී වසමේ රාවතාවත්ත ග්‍රාමයෙහි පිහිටි ධර්මරත්න මාවතේ වරිපනම් අංක 54 දරන ලුනාපාවුලවත්ත නොහොත් ලුනාකැලේ හා නුගගහපිල්ලෑවේ කුඹුර නමැති ඉඩමට 2007 සැප්තැම්බර් මස 06 වැනි දින ඊ. ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සම්පාදිත අංක 2152 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. දේවසුරේන්ද්‍රගේ දේපළ ද, නැගෙනහිරට : සුනිල් පෙරේරාගේ දේපළ ද, දකුණට : ධර්මරත්න මාවත ද සහ බටහිරට : ඇළ ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10.00) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි පහයි තුනක (හෙක්. 0.0253) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, පස, ගහකොළ, පලතුරු ආදී සියලු දේ ද සමග දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 232/113හි ලියාපදිංචි කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ආර්. එල්. කේ. පෙරේරා විසින් 2017.11.30 දින ලියා සහතික කරන ලද අංක 2591 දරන උකස්කරය සහ එකී නොතාරිස් තැන විසින්ම 2017.11.30 වැනි දින ලියා සහතික කරන ලද අංක 2592 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරී.

2021 මාර්තු මස 29 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ 02.

04-675

---

**LE/RE/208**

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 702725000071 සහ 702725000104.

ණයකරුගේ සම්පූර්ණ නම : වීරවර්ණ කුලසූරියගේ සුමුදු ප්‍රියන්ත කුලසූරිය

(මෙහි මින් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2020.11.13 වැනි දින අංක 2202 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2020.11.11 වැනි දින ''මව්බිම'', ''තිනක්කුරල්'' සහ ''සිලෝන් ටුඩේ'' යන පුවත්පත්වල පළකරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන

මුදල් අයකරගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක. 134, බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් **2021/05/11 වන දින ප.ව. 1.00 සිට** පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 3285 සහ 3476 දරන උකස් බැඳුම්කරයන් යටතේ රුපියල් හැත්තෑදෙලක්ෂ හැත්තෑඑක් දහස් අටසිය පනස්පහයි ශත අට (රු. 7,271,855.08) ක මුදලක් වර්ෂ 2020.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

( 01 )
පළමු ණය මුදල - 702725000071.

අංක **3285** දරන උකස් බැඳුම්කරය යටතේ එකී පළමු ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් **විසිහත් ලක්ෂ පහළොස් දහස් පන්සිය හැත්තෑහයයි ශත පනහ (රු. 2,715,576.50)** ක මුදල ද වර්ෂ 2020.09.30 වන දින දක්වා හිඟ මුදල වශයෙන් **රුපියල් දාහත් ලක්ෂ තිස්හත් දහස් හත්සිය අසූඅටයි ශත අනූඑක (රු. 1,737,788.91)** ක්ද වශයෙන් සම්පූර්ණ එකතුව **රුපියල් හතලිස්හතර ලක්ෂ පනස්තුන් දහස් තුන්සිය හැටපහයි ශත හතලිස්එක (රු. 4,453,365.41)** ක මුදල අයකරගැනීම සඳහා ද,

**දෙවන ණය මුදල - 702725000104.**

අංක 3476 දරන උකස් බැඳුම්කරය යටතේ එකී දෙවන ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දහසය ලක්ෂ අනූහතර දහස් හත්සිය හයයි ශත හතලිස්හත (රු. 1,694,706.47) ක මුදල ද වර්ෂ 2020.09.30 වන දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් එකොළොස් ලක්ෂ විසිතුන් දහස් හත්සිය අසූතුනයි ශත විස්ස (රු. 1,123,783.20) ක්ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් විසිඅට ලක්ෂ දහඅට දහස් හාරසිය අසූනවයයි ශත හැටහත (රු. 2,818,489.67) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැත්තෑදෙලක්ෂ හැත්තෑඑක් දහස් අටසිය පනස්පහයි ශත අට (රු. 7,271.855.08) ක මුදලක් අයකර ගැනීම සඳහා ද,

( 02 ) එකී පළමු ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් විසිහත් ලක්ෂ පහළොස් දහස් පන්සිය හැත්තෑහයයි ශත පනහ (රු. 2,715,576.50) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50% ක් ද සහ එකී දෙවන ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් දහසය ලක්ෂ අනූහතර දහස් හත්සිය හයයි ශත හතලිස්හත (රු. 1,694,706.47) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50%ක් බැගින් වූ පොලිය 2020.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

( 03 ) එකී රුපියල් විසිඅට ලක්ෂ තිස්හය දහස් එකසිය හැත්තෑඑකයි ශත අනූඑක (රු. 2,836,171.91) ක මුදල මත අයවිය යුතු මාසිකව 1.50% ක ප්‍රමාද පොළියක් 2020.10.01 වන දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

( 04 ) එකී 1990 අංක 04 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

ණය අංක : 702725000071 සහ 702725000104.

**ඉහත කී උපලේඛනය**

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, එගොඩ පත්තුවේ, වැලිකන්ද ප්‍රාදේශීය සභා සීමාවේ සහ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංකඃ 262 - මහවැව ග්‍රාම නිලධාරී වසමේ මහවැව ග්‍රාමයෙහි පිහිටි මහවැවකැලේ නමැති ඉඩමට 2017.02.28 වන දින ඩබ්ලිව්.ඩබ්ලිව්.එල්.එල්. ගාමිණී බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සම්පාදිත අංකඃ 2365 පිඹුර ප්‍රකාර කැබලි අංක 1 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට පිඹුරු අංක අ.ජ.පි.පො.539 හි කැබලි අංක 03 හා කැබලි අංක 18 ද, නැගෙනහිරට පිඹුරු අංක අ.ජ.පි.පො.539 හි කැබලි අංක 18 හා කැබලි අංක 07 ද, දකුණට පිඹුරු අංක අ.ජ.පි.පො.539 හි කැබලි අංක 07 හා කැබලි අංක 20 ද සහ බටහිරට පිඹුරු අංක අ.ජ.පි.පො.539 හි කැබලි අංක 20 හා කැබලි අංක 03 ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් තිහයි දශම තුනයි පහක (අක්. 0 රූඩ් 02 පර්. 30.35) හෙවත් හෙක්ටෙයාර් බිංදුවයි දශම දෙකයි හතයි නවයයි එකක (හෙක්. 0.2791) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සියළු දේ ද සමග වේ.

ඉහත සඳහන් කැබලි අංක 1 නමැති ඉඩම, පහත විස්තර කර ඇති ඉඩමට සමාන වූවකි ඃ

ඉහත සඳහන් සීමා මායිම් තුළ, මහවැව ග්‍රාමයෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක අ.ජ.පි.පො. 539/1/1 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 19 නමැති ගොඩ ඉඩම් කොටසට මායිම්, උතුරට කැබලි අංක 03 හා කැබලි අංක 18 ද, නැගෙනහිරට කැබලි අංක 18 හා කැබලි අංක 07 ද, දකුණට කැබලි අංක 07 හා කැබලි අංක 20 ද සහ බටහිරට කැබලි අංක 20 හා කැබලි අංක 03 ද යන මායිම් තුළ පිහිටි හෙක්ටෙයාර් බිංදුවයි දශම දෙකයි හතයි නවයයි එකක (හෙක්. 0.2791) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සියළු දේ ද සමග පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක **LDO/H/21/56** හි ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම **අංකඃ පො/බී/සෙ/ප්‍ර/3169 (ගොඩ)** දරන ප්‍රදාන පත්‍රයේ සඳහන්, (464 වන අධිකාරිය වූ) ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධි විධානවලට සහ රක්ෂිත වගන්ති හා කොන්දේසිවලට යටත්ව බැංකුවට උකස් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ බී කලාපයේ නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකරු (ඉඩම්) විසින් පූර්ව අනුමැතිය ඔහුගේ යොමු අංකඃ බී/ඉ/3/8/16 දරන 2017.02.22 දිනැති ලිපියෙන් ප්‍රදානය කර ඇත.

**දෙවන උපලේඛනය**

රක්ෂිත වගන්ති ඃ

1. ඉඩමෙහි හා එය මතුපිට ඇති සියළු ඛණිජ ද්‍රව්‍ය (මේ ප්‍රදාන පත්‍රයෙහි ඛණිජ ද්‍රව්‍ය යන යෙදුම සම්බන්ධයෙන් මැණික් ගල් ද ඇතුළත් වේ.) පිළිබඳ හිමිකම් හා එවැනි යම් ඛණිජ ද්‍රව්‍ය හෑරීමේ, සෙවීමේ, ඒ පිළිබඳව කටයුතු කිරීමේ හා බැහැර ගෙන යෑමේ අයිතිය රජය වෙත වෙන්කර තබා ගනු ලැබේ.

2. ඉඩමට ඇති අයිතිකරුගේ හිමිකම මේ ප්‍රදාන පත්‍රයේ දිනට එම ඉඩම මත ඇති මාර්ග අයිතියනට හෝ වෙනත් පරවශතාවයකට යටත් විය යුතුය.

කොන්දේසි ඃ

1. මෙහි සඳහන් අවම අනු බෙදුම් ඒකකය, එනම් උස්බිම් හෙක්ටෙයාර් 0.100 ට හෝ වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් හෙක්ටෙයාර්/අක්කර ......ට වඩා ප්‍රමාණයෙන් අඩු වූ මෙම ඉඩමේ බෙදා වෙන් කළ කොටසක්/අයිතිකරු විසින් බැහැර නොකළ යුතුය.

2. මෙහි නියමිත අවම භාගයට වඩා අඩු එනම්, හෙක්ටෙයාර් 0.100 වඩා අඩු මෙම ඉඩමේ නොබෙදා වෙන් කළ කොටසක් අයිතිකරු විසින් බැහැර නොකළ යුතුය.

3. කිසිම තැනැත්තකු 1 වන කොන්දේසියේ සඳහන් අවම අනු බෙදුම් ඒකකයට වඩා අඩු ප්‍රමාණයක් වූ ඉඩමේ බෙදූ කොටසක අයිතිකරු නොවිය යුතුය.

4. 2 වන කොන්දේසියේ සඳහන් අවම භාගයට අඩු වූ ඉඩමේ නොබෙදූ කොටසකට කිසිම තැනැත්තකු අයිතිකරු නොවිය යුතුය.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු (453 වන අධිකාරය වූ) වාරිමාර්ග ආඥාපනතේ විධිවිධානවලට හා ඒ යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. දිසාපතිවරයාගෙන් ලිඛිත අවසරය දී උචිත බලධරයාගෙන් බලපත්‍රයක් ද ලබා ඇත්නම් මිස, අයිතිකරු විසින් ඉඩමෙහි හෝ ඒ මතුපිට කිසිම ඛණිජ ද්‍රව්‍යයක් කැණීම, සෙවීම, ලබා ගැනීම, තමාගේ ප්‍රයෝජනයට ගැනීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකළ යුතුය.

7. ප්‍රාදේශීය ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අවසරයක් ඇතිව මිස, ඉඩමෙහි හෝ එහි කිසිම කොටසක අයිතිය බැහැර නොකළ යුතුය.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන ගාල්ලගේ විසින් 2017.05.25 දින ලියා සහතික කරන ලද අංක 3285 දරන උකස්කරය සහ එකී නොතාරිස් තැන විසින්ම 2018.08.02 දින ලියා සහතික කරන ලද අංක 3476 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරී.

දිනය ඃ 2021.04.08
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ - 02.

04-776

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.